**ගරු ස්කොට් මොරිසන් මැතිතුමා (පා.ම.)**
**ආගමන සහ වෙරළාරක්ෂක අමාත්‍ය**

**මාධ්‍ය නිවේදනයයි**

**2014 නොවැම්බර් 29 සෙනසුරාදා**

## පුද්ගල ජාවාරම් ක්‍රියාවක් මැඬලයි. පිරිස ආපසු ශ්‍රී ලංකාවට

ශ්‍රී ලංකාවේ සිට ක්‍රියාත්මක වන පුද්ගල ජාවාරම් මැඬලීම සඳහා ශ්‍රී ලංකා රජය සමඟ අඛණ්ඩ ලෙස ඉතා සමීප සහයෝගීතාවෙන් කටයුතු කිරීමට ඔස්ට්‍රේලියානු රජය පියවර ගනී.

2014 නොවැම්බර් මස 26 වැනි දින ඔස්ට්‍රේලියාව කරා නීති විරෝධී ලෙස බෝට්ටු මඟින් ශ්‍රී ලාංකිකයන් 38 දෙනෙකු පුද්ගල ජාවාරම්කරුවන් ලෙස ඇතුළු වීමට දැරූ ව්‍යායාමය සම්පූර්ණයෙන් ව්‍යර්ථ කිරීමට හැකි විය.

ඔස්ට්‍රේලියාව කරා නීති විරෝධී ලෙස බෝට්ටු මඟින් යාත්‍රා කිරීමට දරන සෑම උත්සාහයක් තුළින් ම පුද්ගල ජාවාරම්කරුවන්ට සහ ඔවුන්ගේ ගනුදෙනුකරුවන්ට යම් දිරියක් ලැබේ යැයි ඔවුන් කල්පනා කළ ද කිසිදු විටෙක එවැනි ඉඩක් නොලැබෙනු ඇත.

"නීති විරෝධී ලෙස බෝට්ටු මඟින් ඔස්ට්‍රේලියාවට ඇතුළු වීමට උත්සාහ දරන පුද්ගලයන් සඳහා අත් විය හැකි ප්‍රතිඵල දෙකක් තිබෙනවා" ආගමන සහ වෙරළාරක්ෂක ගරු අමාත්‍ය ස්කොට් මොරිසන් මහතා පවසයි.

"ඔවුන්ව මඟ දී අත්අඩංගුවට ගෙන ආපසු එවීම හෝ ඔස්ට්‍රේලියාව හැර වෙනත් රටකට යැවීම මෙහිදී සිද්ධ වෙනවා. ඔවුන්ගේ සරණාගතභාවය විමසා බැලීමට සහ නැවත පදිංචි කර වීම සඳහා බොහෝ විට පැපුවා නිව් ගිනි හෝ නාවුරු කියන රටවලට ඔවුන්ව පිටත් කර යැවෙනු ඇති. ඔස්ට්‍රේලියාව තුළ පදිංචි වීම කිසිම විටෙක ලැබෙන විසඳුමක් නොවෙයි.

"මෙම නීතිය හැම කෙනෙකුටම සමානයි. කිසිදු විශේෂිත තත්ත්වයක් කිසිවෙකුටත් නැහැ."

"මෙය ඔස්ට්‍රේලියානු රජයේ ප්‍රතිපත්තියයි. එය වෙනස් වන්නේ නෑ."

පුද්ගල ජාවාරම් වැඩසටහන් මැඬලීමට සහ සිය වෙරළාරක්ෂක කටයුතු තර කර ගැනීමට ඔස්ට්‍රේලියාව සිය කලාපීය පාර්ශ්වකරුවන් සමඟ අඛණ්ඩ ව සහයෝගීතාවෙන් කටයුතු කරනු ඇත.

පුද්ගල ජාවාරම්කරුවන්ගේ අසත්‍ය ප්‍රචාරවලට ජනතාව නොරැවටිය යුතු වන අතර නීති විරෝධී ලෙස බෝට්ටු මඟින් ඔස්ට්‍රේලියාවට පැමිණීමට කිසි විටෙකත් කල්පනා නොකළ යුතුය. එවැනි ක්‍රම මඟින් ඔස්ට්‍රේලියාවේ පැමිණීමේ මං සම්පූර්ණයෙන් අවුරා ඇත.